නවසීලන්තයේ සුපිරි වෙළඳසැල් සංකීර්ණයක සිට ජනතාවට අයෙකු ප්‍රහාරයක් එල්ල කිරීමේ සිදුවීම සියළුම මාධ්‍ය මගින් පාහේ ආවරණය කෙරී තිබිණි. මේ අතර එය ආවරණය කරන ඉරිදා ලංකාදීප පුවත්පතේ "නවසීලන්ත පිහි ඇණුම්කාරයා ලාංකික් තරුණයෙක්" යන සිරස්තලයෙන් යුතුව පළවී ඇති ලිපියකි. එම ලිපිය අන්තර්ගතයේ එක් තැනක සඳහන් වන්නේ, "ත්‍රස්ත ප්‍රහාරය එල්ල කලේ මුස්ලිම් තරුණයෙකු බව එරට අගමැතිනී ජසින්ඩා ආර්ඩන් විසින් මාධ්‍ය හමුවවේදී පැවසූ බවයි. කෙසේ නමුත් අගමැතිනී ජසින්ඩා ආර්ඩන් පැවැත්වූ එම මාධ්‍ය හමුවේ ඇය ප්‍රකාශ කළ තොරතුරු ආවරණය කරනා ද අයිලන්ඩ් පුවත්පතේ සඳහන් වන්නේ "එම ප්‍රහාරය එල්ල කළ අය ශ්‍රී ලාංකිකයෙකු" බව පමණක් ඇය ප්‍රකාශ කළ බවටයි. අගමැතිනී ජසින්ඩා ආර්ඩන් කිසිදු තැනක එම ප්‍රහාරකයාගේ වාර්ගිකත්වයක් හෝ ජනවර්ගයක් සඳහන් නොකළ බව ඇගේ කතාවේ හඬ පටයෙන්ද තහවුරු වේ.
මෙසේ බලන විට, අගමැතිනී ජසින්ඩා ආර්ඩන්ගේ ප්‍රකාශයේ නොමැති "මුස්ලිම්" වාර්ගිකත්වයක් පිළිබඳ ඇය පැවසූවා යැයි ඉරිදා ලංකාදීප සඳහන් කරන්නේ මන්ද? එය පාඨකයා නොමග යැවීමක්, සාවද්‍ය වාර්තාකරණයක් සහ ඒ නයින් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක්ද නොවන්නේද?
මූලාශ්‍ර:
https://www.youtube.com/watch?v=yMUu4Y4zqSk
**#MediaEthicsSL #lka #sinhalanews #SundayLankadeepa #SundayIsland**